# 24 අරුණලු නැගේ

සිංහල සාහිත්‍යයේ කෝට්ටේ යුගය ශෝභාවත් කළ ශ්‍රේෂ්ඨ කවියෙකු වූ වෑත්තෑවේ හිමිපාණන් විසින් රචිත ගුත්තිල කාව්‍යය අපට ඇති උසස් කාව්‍ය ග්‍රන්ථයකි.

මේ පාඩමේ දැක්වෙන්නේ ගුත්තිල පඬිතුමා දෙව්ලොව ගමන සඳහා සැරසුණු උදය කාලය පිළිබඳ රමණීය වර්ණනාවකි.

01. තඹ වතුරෙව් තුරු බිජු රැඳි නුබ කෙතට
දිලි ළවගෙව් ගනඳුරු හුණ වන පෙතට
දිනපති දෙව් රද එන මඟ නියම කොට
බැඳි දද එව් අරුණලු නැඟි පෙරඹරට

02. එතර දිනිඳු හිමි දැක විලඹුවෝ හැමා
බමර කිකිණි සැදි සියපත් මෙවුල් දමා
තිසර දිමුතු මුතුහර පැළඳ මන රමා
නොහැර පහස විඳිනට සැදුණු නො ව පමා

03. සොඳුරු තුරුණු සියපත් සිය රස් වතුර
ඉඳුරු දෙසින් වැද නුබ ගඟ එත පැතිර
අඳුරු සෙවල් තුරු සියපත් සිසි තිසර
අතුරු දහන් කර පිරුණේ ලොව නොහැර

04. බොල් පිනිබිඳු බැමීය අතු නැමීය
මල් මුවරඳ තෙමීය නල හැමීය
පුල් තඹරෙහි බිමීය බිඟු බිමීය
මල් සර සැව් දැමීය රිය හිමීය

05. වැදතුල් ළහිරු රස් යුග කෙළ ගිම් ගිහිණි
තුරුමල් පතළ පෙණ ගනදුරු පෙණ සිදිණි
මනකල් කමලුපුල් වන මිණි ගණ පෙනිණි
එමකල් දෙවන දිනි දෙව් රිය ද නික්මිණි

01. අර්ථය : තරු නමැති බීජ රැඳී ඇති අහස නමැති කුඹුරට තඹ වතුරක් වැනි වූ ද තද අන්ධකාරය නමැති හුණ වනයට දිලිසෙන ලැව් ගින්නක් වැනි වූ ද දවසට අධිපති වූ දිව්‍ය රාජයා (සූර්යයා) එන මඟ බඳනා ලද කොඩි බඳු වූ ද අරුණාලෝකය පෙරදිග අහසෙහි නැංගේ ය.

විස්තර : අරුණාලෝකය පෙරදිග අහසෙහි නැගේ. ඒ තරු වැනි බීජ රැඳී ඇති අහස් කෙතට ගලා එන නව වතුරකි. එසේ ම අඳුර නමැති හුණ කැලෑව නසන ලැව් ගින්නකි. සූර්යයා එන මඟ දැක්වීමට බැන්දා වූ කොඩි සමූහයකි.

02. අර්ථය : එවිට විල් නමැති අඹුවෝ සූර්යයා නමැති ස්වාමියා දැක, බමර නාදය නමැති කිංකිණිවලින් සැදි පියුම් දමින් ද හංසයන් නමැති දීප්තිමත් මුතුපට ද පැළඳගෙන නොපමාව සූර්ය ස්පර්ශය ලැබීමට සැරසුණාහ.

විස්තර : සූර්යයා ස්වාමියා ය. විල් අඹුවෝ ය. තම ස්වාමියාගේ සම්ප්‍රාප්තියත් සමඟ ප්‍රීති වන විල්, සැරසුණු ආකාරය විචිත්‍රවත් ලෙස දැක්වූ අයුරු ය.

03. අර්ථය : සුන්දර වූ තරුණ සූර්යයාගේ රශ්මිය නමැති වතුර නැගෙනහිර දිසාවෙන් අහස් ගඟට වැදී පැතිර ගොස් අන්ධකාරය නමැති සෙවෙල් ද තාරකා නමැති පියුම් ද සඳ නමැති හංසයන් ද නැති කොට මඳ ඉඩකුදු නොතබා ලොවේ පිරී ගියේ ය.

විස්තර : තරුණ සූර්යයා ලෝකයේ අන්ධකාරය නසා දමා මුළු ලොව ඒකාලෝක කළ අයුරු මෙහි දී පැවසේ.

- සියපත් සේ: සියපත් යනු නෙළුම් ය. හිරු එළියට නෙළුම් පුබුදු වෙතියි සලකා හිරු නෙළුම් මල්හි නෑයකු කොට දක්වේ. හිරුට සියපත් සිය (නෑයා) යන නාමය යෙදෙන්නේ ඒ අරුතිනි.

04. අර්ථය : අතු නැමී බොල් පිනි බිඳු බිමට වැටුණේ ය. මල් රොනින් තෙමී ගිය සුළඟ හමා ගියේ ය. පිපුණු නෙළුම් මල් හී මී බී බමරා කැරකුණේ ය. රති ස්වාමියා වූ අනංගයා මල් හී ද දුන්න ද අත හැරියේ ය.

විස්තර : ගන පිනිබිඳු බිමට පතිත වේ. සුගන්ධවත් සුළඟ හමා යේ. මී බී බමරු බමති. (ජනයා තුළ) කාමාශක්ත හැඟීම් ඇති නොකළේ ය.

● රිය හිමි : රතියගේ ස්වාමියා එනම්, අනංගයා ය. කාමයට අධිපති යැයි කියන මොහුගේ දුන්න උක් දඬෙකි. දුනු දිය බිඟු වැලකි. ඊ තල නෙළුම්, අසෝකා, අඹ, දෑ සමන්, නිලුපුල් යන මල් පසයි. පැරණි කවීහු මිනිස් සිතෙහි හට ගන්නා රාග චේතනාව දෙවියකු කොට මූර්තිමත් කළහ. මේ ඊවලින් විදි කල ස්ත්‍රීන් හා පුරුෂයන් තුළ සිතෙහි මුළාව, තාපය, වියැළීම, දරදඬු බව හා වියරුව ඇති වෙතැයි ද කියති.

05. අර්ථය : තරුණ සූර්යයාගේ රශ්මිය නමැති මහා ග්‍රීෂ්මයෙන් ගහණ වූ කල්පාන්ත ගින්න වැදී තාරකා සමූහය නැමැති පෙණ පිඬු පැතිරුණු ගන අඳුර නැමැති මුහුද සිඳුණේ ය. සිත් ඇදගන්නා නෙළුම්, මානෙල් වන නමැති මැණික් සමූහය පෙනිණි. එකල්හි දෙ වන සූර්යයකු වැනි වූ රථය ද නික්මිණි.

විස්තර : සයුර සිඳුණු විට එහි පත්ලේ ඇතැයි කියන මැණික් සමූහය පෙනෙන්නට වෙයි. ලොව පුරා සිටි අඳුර සයුරට ද අහසේ දිලෙන තරු සමූහය සයුරේ පෙණ පිඬු සමූහයට ද පොළෝ මතු පිට ඇති පියුම් උපුල් සයුරු පත්ලේ වෙතියි කියන මැණික් රැසට ද සමාන කර ඇත.

## ක්‍රියාකාරකම 01

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. මේ කවි පෙළෙන් දැක්වෙන්නේ දවසේ කවර වේලාවක් ද?
ii. පළමු කවියේ අරුණාලෝකය විහිදෙන ආකාර තුනක් දක්වා ඇත. ඒ ආකාර තුන වෙන් වෙන් ව ලියන්න.
iii. විලඹුන් සැරසුණු ආකාරය විස්තර කරන්න.
iv. තුරුණු හිරුරැස්වල පැතිරීම කවියා වර්ණනා කර ඇත්තේ කෙසේ ද?
v. 'පිනිබිඳු, සුළං සහ මී මැස්සන් ගැන කෙරෙන වර්ණනා නිසා පාඨකයා තුළ අපූරු චිත්‍රයක් මැවේ' එය පැහැදිලි කරන්න.
vi. සූර්යෝදය සමඟ අඳුර පහ වූ ආකාරය කවියා දැක ඇත්තේ කෙසේ ද?

## ක්‍රියාකාරකම 02

i. මේ පද විසන්ධි කර ලියන්න.

ගනඳුරු, දිනිඳු, මහේෂ්වර, පෙරඹර

ii. මේ සමාන පද විග්‍රහ කොට දක්වන්න.

සියපත්, දිනපති, මුතුහර, අරුණලු

## පැවරුම

01. මේ පද්‍ය පන්තිය කණ්ඩායම් වශයෙන් බෙදී ගායනා කරන්න.

02. මේ පද්‍ය පන්තියෙහි යෙදී ඇති උපමා හා උපමේය තුනක් වෙන් කොට දක්වන්න.

03. 'සන්ධ්‍යාව' ගැන පද්‍ය කීපයක් ලියන්න.

04. "ඔබට උසස් විභාග ප්‍රතිඵලයක් හිමි වීම නිසා ඊට සම්මානයක් වශයෙන් විදේශ රටක සංචාරයකට අවස්ථාවක් ලැබිණි යැයි සිතන්න. එම විදේශ සංචාරය අරඹමින් හිමිදිරි කාලයේ ගුවන්යානයකින් අහසට වන් ඔබට ගුවන්යානයේ කවුළුවෙන් සිත්කලු ලෙස දිස් වූ අවට පරිසරය හා මිහිතලයේ රමණීය දර්ශනය" විස්තර කරමින් වර්ණනාත්මක වාක්‍ය රචනයක් ලියන්න.